# යුද්ධය ජය ගැනීමට එක් වූ අයුරින් ආර්ථිකය නැංවීමටත් එක්සත් වෙමු

## ඇමැති මිලින්ද බෞද්ධ නිලධාරී හමුවේදී කියයි

යුද්ධය ජයගැනීමට සමාජය එක්සත් වූවා සේම ආර්ථික සමෘද්ධිය ළඟාකර ගැනීමටත් සමාජ එකමුතුභාවය අවශ්‍ය යැයි එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කොළඹ දිස්ත්‍රික් අපේක්‍ෂක අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා පාදුක්කේදී පැවසීය.

පාදුක්ක අරුක්වත්ත සදාහරිත උණ අරණෙහිදී පැවැති සමෘද්ධි නිලධාරීන්ගේ හමුවක් අමතමින් තවදුරටත් අදහස් දැක්වූ අමාත්‍ය මොරගොඩ මහතා මෙසේද පැවසීය.

රටේ පැවැති තීරණාත්මක අභියෝගය දැන් නිමාවට පත්ව තිබෙනවා. දැන් අපහමුවේ තිබෙන වගකීම වන්නේ රට ආර්ථික වශයෙන් සමෘද්ධිමත් කර ස්ථාපිත සාමය තිරසාර සාමයක් බවට පත්කිරීමයි. එම අභියෝගය ජය ගැන්මට මහින්ද රාජපක්‍ෂ ජනාධිපතිතුමාට ශක්තියක් තිබේ. එනිසා මෙම මහ මැතිවරණයෙන් ජනපතිවරයාත් රජයත් ශක්තිමත් කිරීම අපේ යුතුකමක්.

සමෘද්ධි නිලධාරීන්ට බලපාන ගැටලු පිළිබඳව තමාද මහා භාණ්ඩාගාරය සමග සාකච්ඡා කර ඇතැයි කී අමාත්‍ය මොරගොඩ මහතා ඒවා ගැන ජනාධිපතිවරයාගේත් අවධානය යොමුකොට විසැඳීමට ක්‍රියාකරන බව අවධාරණය කළේය.

මෙම සමෘද්ධි නිලධාරී හමුවට ශ්‍රී ලංකා ජාතික සංගමයේ මහලේකම් ආර්.ඒ.ඩී. සිරිසේන මහතාද ගලගෙදර පාදුක්ක ප්‍රදේශවල සමෘද්ධි නිලධාරීහුද සහභාගි වූහ.



කොළඹ දිස්ත්‍රික් එක්සත් ජනතා නිදහස් සන්ධාන මන්ත්‍රී ධුර අපේක්ෂක අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ ඇමැති මිලින්ද මොරගොඩ මහතා පාදුක්කේදී පැවති සමෘද්ධි නිලධාරීන්ගේ හමුවක් ඇමතූ අවස්ථාව.